## ශ ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය

### 1. මූල්‍ය ප්‍රකාශන

#### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2011 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාර්ත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

#### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

##### 1.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ශ්‍රී.ලං.ගි.ප්‍ර)

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| ශ්‍රී.ලං.ගි.ප්‍ර. යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| ශ්‍රී.ලං.ගි.ප්‍ර. 10 | (අ) | පෙර වර්ෂ වල දෝෂ නිවැරදි කිරීම පිණිස රු. 2,340,263 ක මුදලක් සමුච්ත අතිරික්තයට ගලපා තිබුණි. එසේ වුවත්, මෙම ගැලපීම් ශ්‍රී.ල.ගි.ප්‍ර. 10 හි සඳහන් නියමයන්ට අනුව ගිණුම්වල අනාවරණය කර නොතිබුණි. |
| | (ආ) | ඇතිවිය හැකි වගකීම පිළිගත හැකි තොරතුරු මත පදනම්ව සලකා බැලීමකින් තොරව කාර්යාංශයේ නිලධාරීන් ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තු මත පදනම්ව රු. මිලියන 223 ක මුදලක් උපචිත වියදම් ලෙස සමාලෝචිත වර්ෂයේදී වෙන් කර තිබුණි. |

##### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) රු. 1,167,900 කට මිලට ගෙන තිබුණු ලැප්ටොප් පරිගණක 8 ක් ගිණුම් ගත කර නොතිබුණි.

(ආ) රු. 1,150,000 ක් වූ පරිත්‍යාග මුදලක් දේශීය ප්‍රවර්ධන වියදම් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ඇ) ජාත්‍යන්තර ඉන්දියානු චිත්‍රපටි ඇකඩමි (ජා.ඉ.චි.ඇ.) උත්සවයේ තථ්‍ය වියදම නියමිත පරිදි හඳුනාගෙන සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු මුදලක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) ජාත්‍යන්තර ඉන්දියානු චිත්‍රපට ඇකඩමි උලෙල සඳහා සපයන ලද භාණ්ඩ හා සේවා සඳහා රු. 120,694,122 ක මුදලක් අදාල සැපයුම්කරුවන්ගෙන් භාණ්ඩ හා සේවා තථ්‍ය වශයෙන් හා නිවැරදිව ලැබුණු බවට තහවුරු කර ගැනීමකින් තොරව උපචිත වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

1.2.3 නොසැසඳු ගිණුම්

අදාල උපයෝගි වාර්තාවල සඳහන් ශේෂයන් සමඟ සැසඳීම් නොකිරීම නිසා කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන හා අදාල උපයෝගි වාර්තා අතර පහත සඳහන් වෙනස්කම් නිරීක්ෂණය විය.

| විස්තරය | මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය | උපයෝගි වාර්තා වල විස්තරය | උපයෝගි වාර්තා අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|---|
| | රු. | | රු. | රු. |
| ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයට (ශ්‍රී.ලං.සං.හෝ.ක.ආ) ගෙවිය යුතු | 54,179 | ශ්‍රී.ලං.සං.හෝ.ක. ආයතනයේ ගිණුම් | 734,655 | 680,476 |
| ශ්‍රී.ලං.සං.හෝ.ක. ආයතනයෙන් ලැබිය යුතු | 658,734 | - එම - | නැත | 658,734 |

1.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉන්දියානු චිත්‍රපට ඇකඩමි සම්මාන උළලේ සංවිධායක ආයතනයෙන් ලැබිය යුතු මුදල් එම ආයතනයෙන් ලැබිය යුතු මුදල් ලෙස ගිණුම් ගත කර නොතිබුණි. විගණනයට ඉදිරිපත් කල තොරතුරු වලට අනුව, ඉහත ආයතනය වෙනුවෙන් කාර්යාංශය ලබා දී තිබුණු හෝටල් කාමර පහසුකම් වෙනුවෙන් එම ආයතනයෙන් දල වශයෙන් රු. මිලියන 20 ක් අයකර ගත යුතුව තිබුණි.

(ආ) එක්සත් රාජධානියේ කාර්යාලයෙන් ලැබිය යුතු රු. 3,304,920 ක් අදාල වගකිවයුතු නිලධාරීන්ගෙන් වර්ෂ 2 ක වැඩි කාලයක සිට අයකර ගෙන නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට අයත් ගොඩනැගිලි නවීකරණය වෙනුවෙන් කාර්යාංශය දරා තිබුණු රු. 28,047,842 ක ප්‍රාග්ධන වියදම් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

1.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

මාධ්‍යවේදීන් පැමිණීමේ වැඩ සටහනට අදාල ක්‍රියාත්මක කල වැඩ සටහන් සංඛ්‍යාව හා මාධ්‍යවල පල කිරීම් විස්තර, විස්තරාත්මක උපලේඛන, සත්‍යාපන වාර්තා, ලදුපත් හා ඉන්වොයිසි, ගුවන් ගමන් පහසුකම් භාවිතා කල අයගේ විස්තර, උපයෝගි ලියවිලි යනාදි සාක්ෂි නොවීම නිසා ගිණුම්වල වූ එකතුව රු. 107,416,107 ක විෂයයන් හතක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කල නොහැකි විය.

1.2.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන යහපාලනය සඳහා වූ රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ චක්‍රලේඛය. | |
| (i) 6 පරිච්ඡේදයේ 6.5.1 වගන්තිය | මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වරයා වෙත ඉදිරිපත් කල යුතු වුවත්, සමාලෝචිත වර්ෂය සඳහා කෙටුම්පත් වාර්ෂික වාර්තාව 2012 ජුලි 31 දින දක්වා විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) 9 පරිච්ඡේදයේ 9.12 වගන්තිය | ව්‍යාපාරයක් විසින් අනුගමනය කරනු ලබන ඕනෑම සුභ සාධන යෝජනා ක්‍රමයක් සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතුය. එසේ වුවත්, කාර්යාංශයේ සේවක වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා එම අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (iii) 9 පරිච්ඡේදයේ 9.14.1 වගන්තිය | මානව සම්පත් කළමනාකරණයට අදාල රීති හා රෙගුලාසි පිළිබඳව සියලු කරුණු ඇතුලත් මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පරිච්ඡේදයක් සහිත පරිපාටි සංග්‍රහය භාණ්ඩාගාර ලේකම්ගේ එකඟත්වය සහිතව පාලක මණ්ඩලය විසින් අනුමත කල යුතු වුවත් කාර්යාංශය මෙම නියමයන් අනුගමනය කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 2006 ජනවාරි 25 දිනැති අංක 08 දරන ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතන චක්‍රලේඛයේ 4 පරිච්ඡේදයේ 4.2.1 (අ) සහ (ඇ) වගන්ති. | අවම වශයෙන් වර්ෂ තුනක කාලයක් ආවරණය වන පරිදි ඉදිරි වර්ෂය සඳහා විස්තරාත්මක සැලැස්මක් සමඟ ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කල යුතු වුවත්, එම නියමය පරිදි කාර්යාංශය විසින් එසේ සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. |
| (ඇ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑෆ්අයි/2002/2 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය. | පරිගණක, පරිගණක උපාංග සහ මෘදුකාංග සඳහා ස්ථාවර වත්කම් ලේඛණයක් චක්‍රලේඛයේ අවශ්‍යතාවය පරිදි පවත්වා නොතිබුණි. |
| (ඈ) | 2008 ජනවාරි 11 දිනැති අංක පීඊඩී/56 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | ඉදිරි මාස 06 ක කාලපරිච්ඡේදයක් සඳහා අවශ්‍ය කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය සැලකිල්ලට ගත් පසුව 2011 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ආයතන වෙත ඇති අතිරේක මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කල යුතුය. එසේ වුවත් කාර්යාංශයේ අතිරේක මුදල් ඒකාබද්ධ අරමුදලට බැරකර නොතිබුණි. විගණනය විසින් කරන ලද ගණනය කිරීම්වලට අනුව සමාලෝචිත වර්ෂයේ අතිරේක මුදල් ප්‍රමාණය රු. මිලියන 500 ක් පමණ විය. |
| (ඉ) | 2008 පෙබරවාරි 09 දිනැති අංක 13/2008(iv) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය. | චක්‍රලේඛ නියමයන්ට අනුව, කාර්යාංශයේ කළමනාකාර අධ්‍යක්ෂවරයාට මාසයක් තුළදී උපරිම වශයෙන් ඉන්ධන ලීටර් 120 ක් ලබාගත හැකිය. එසේ වුවත්, චක්‍රලේඛ නියමයන් නොසලකා කළමනාකාර අධ්‍යක්ෂවරයා විසින් මාසයකට ඉන්ධන ලීටර් 207 ක් පමණ ලබාගෙන තිබුණි. |
| (ඊ) | 2011 පෙබරවාරි 11 දිනැති අංක පීඊඩී/ඊඑන්/2011/01 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය. | රජයේ ආයතනයට හෝ රජයේ සංවර්ධන ව්‍යාපෘතියකට හැර, වාර්ෂිකව අනුමත වැඩ සටහන මගින් රු. 100,000 ට වඩා වැඩි ආධාර/ පරිත්‍යාග සිදු කිරීම සඳහා රාජ්‍ය ව්‍යාපාරයක් විසින් ගරු මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතුය. මෙම අනුමැතිය ලබා ගැනීමෙන් තොරව කාර්යාංශය විසින් රු. 1,150,000 ක් පෞද්ගලික සංවිධාන දෙකකට ලබා දී තිබුණි. |
| (උ) | මුදල් රෙගුලාසි අංක 371 | අවස්ථා දහතුනකදී රු. 20,000 උපරිම සීමාව ඉක්මවා රු. 7,882,940 ක අත්තිකාරම් නිලධාරීන්ට ලබාදී තිබුණි. |
| (ඌ) | ආයතන සංග්‍රහයේ VI පරිච්ඡේදයේ 2.10 වගන්තිය. | කාර්යාංශයේ බඳවා ගැනීම් මාරු කිරීම්, උසස් කිරීම්, වැටුප් වර්ධක ගෙවීම්, සේවකයින්ට එරෙහි විනය ක්‍රියාමාර්ග යනාදියට අයත් ලිපි පිටපත් විගණනයට ඉදිරිපත් කල යුතුය. එසේ වුවද කාර්යාංශය විසින් එම ලිපි පිටපත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

### 1.2.7 අධිකාර බලය නොලත් ගනුදෙනු

පාලක මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීමකින් තොරව, එක්සත් ජනපද කාර්යාලය සඳහා නිලධාරීන් තිදෙනෙකු බඳවා ගෙන ඔවුන් සඳහා රු. 3,786,970 ක මුදලක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කාර්යාංශයේ වැඩ කටයුතු වලින් වූ ප්‍රතිඵලය රු. 658,411,571 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 12,280,470 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.646,131,101 වර්ධනයක් දැක්වුණි. රු. 138,128,082 කින් සංචාරක සංවර්ධන හා ආගමන බදු සහ වෙනත් ආදායම් වැඩිවීම සහ දේශීය ප්‍රවර්ධන වියදම් රු. 472,233,248 කින් අඩුවීම මූල්‍ය ප්‍රතිඵලයෙහි වැඩිවීමට ප්‍රධාන හේතුව වී තිබුණි.

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේ කාර්යාංශයේ ආදායම රු. මිලියන 1,248 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේ වූ රු. මිලියන 1,110 සමඟ සැසඳීමේදී 12% ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. එසේම ඉකුත් වර්ෂයේ සංචාරක ප්‍රවර්ධන වියදම් වෙනුවෙන් වැය කර තිබුණු රු. මිලියන 1,098 සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂය තුලදී ඒ සඳහා රු. මිලියන 590 ක් වැයකර තිබුණි. මේ අනුව 86% ක අඩුවීමක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂය සමඟ සමාලෝචිත වර්ෂය සැසඳීමේදී කාර්යාංශයේ ආදායම් හා වියදම් වල වෙනස්වීම් පහත දැක්වේ.

| | 2011<br>රු. (මි) | 2010<br>රු. (මි) | වෙනස<br>රු. (මි) | % |
|---|---:|---:|---:|---:|
| ආගමන හා සංචාරක සංවර්ධන හා බදු | 1,184 | 1,030 | 154 | 15 |
| වෙනත් ආදායම් | 64 | 79 | 15 | 23 |
| පරිපාලන වියදම් | 58 | 57 | 01 | 1.7 |
| සංචාරක ප්‍රවර්ධන වියදම් | 508 | 979 | 472 | 93 |
| ක්ෂය හා වෙනත් වියදම් | 24 | 61 | 37 | 154 |
| ශුද්ධ අතිරික්තය | 658 | 12 | 646 | 5,383 |

2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

| ස්කන්ධ අනුපාත | සම්මත අනුපාතය | 2011 | 2010 | 2009 |
|---|---|---|---|---|
| ජංගම අනුපාතය | 2.1 | 4.63 | 2.47 | 1.73 |
| ක්ෂණික අනුපාතය | 1.1 | 4.60 | 2.45 | 1.71 |

ඉකුත් වර්ෂ දෙක සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ ජංගම හා ක්ෂණික අනුපාත ක්‍රමයෙන් ඉහල ගොස් තිබුණි. සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ මුළු ජංගම වත්කම් වලින් පිළිවෙලින් 68% ක් හා 30% ක් මුදල් හා මුදල් හා සමාන වත්කම්වලින් නියෝජනය විය. එසේ වුවත්, විධිමත් මුදල් කළමනාකරණයක් නොවීම නිසා අතිරික්ත මුදල් දිගු කාලීන සහ මධ්‍ය කාලීන ආයෝජන වල යොදවා නොතිබුණි. සමාලෝචිත වර්ෂය මුළුල්ලේ රු. මිලියන 500 කට වැඩි අතිරික්ත මුදල් බැංකු ගිණුම්වල පැවතුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

3.1 අලෙවිකරණ හා ප්‍රවර්ධන කටයුතු පිළිබඳ කාර්යය සාධනය

සමාලෝචිත වර්ෂයේදී සහ ඉකුත් වර්ෂයේදී පිළිවෙලින් රු. මිලියන 508 ක් සහ රු. මිලියන 979 ක් අලෙවිකරණ සහ ප්‍රවර්ධන කටයුතු සඳහා කාර්යාංශය වැය කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුලදී හා ඉකුත් වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද ඇතැම් ප්‍රවර්ධන කටයුතු සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එක්සත් රාජධානි කාර්යාලයේ කටයුතු:

නියැදි විගණන පරීක්ෂණයකට අනුව එක්සත් රාජධානියේ උප කාර්යාලය විසින් ක්‍රියාත්මක කර තිබුණු ප්‍රවර්ධන කටයුතු සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂයේදී සහ ඉකුත් වර්ෂයේදී එක්සත් රාජධානි සහ අයර්ලන්ත කාර්යාල විසින් ඒකාබද්ධ අලෙවිකරණ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සඳහා පිළිවෙලින් රු. 1,613,571 ක් සහ රු. 6,973,111 ක් වැය කර තිබුණි. එසේ වුවත්, කටයුත වලින් අපේක්ෂිත ප්‍රතිඵල ලඟාකරගත් බව ඇගයීමකට ලක්කර නොතිබුණි.

(ii) කාර්යාංශයේ පරිපාටි වලට අනුව, වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සඳහා පිරිවැය හා ප්‍රතිඵල පිළිබඳ විශ්ලේෂණ සහ පිරිවැය ඇස්තමේන්තු සකස් කර පාලක මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. මෙයට අමතරව, වැඩ සටහන් ක්‍රියාතමක කිරීමට තෝරාගත් ආයතන සමඟ ගිවිසුම් ඇතිකර ගෙන නොතිබුණි.

(iii) කාර්යාංශයේ ප්‍රධාන කාර්යාලයේ අනුමැතියකින් තොරව හා හදිසි අවශ්‍යතාවයක් ලෙස දක්වා ප්‍රචාරන පත්‍රිකා 2000 ක් රු. 519,000 ක් වැය කර මුද්‍රණය කර තිබුණි. ප්‍රචාරණ පත්‍රිකාවල තේමාව සහ එම පත්‍රිකා උපයෝජනය පිළිබඳ විස්තර ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) මාධ්‍යකරුවන් පැමිණීමේ සහ සංචාරයන සඳහා හුරු කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

(i) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කර තිබුණු ඉහත වැඩ සටහන් සඳහා රු. මිලියන 22.9 ක් වැය කර තිබුණි. උපරිම ප්‍රතිලාභ රටට ලබාදීම පිණිස, සුදුසු සහ වාසිදායක මධ්‍යකරුවන් තෝරා ගැනීම මුල් කර ගත් සමාලෝචිත වර්ෂය තුලදී ක්‍රියාත්මක කල යුතු වැඩ සටහන් සංඛ්‍යාව සැලසුම් කර නොතිබුණි. මේ අනුව, විධිමත් මාධ්‍යය තෝරා ගැනීමේ සැලසුමකින් තොරව තත්කාර්ය පදනමකින් වැඩසටහන් ක්‍රියාත්මක කර තිබුණු බව නිරීක්ෂණය විය.

(ii) සමාලෝචිත වර්ෂය තුලදී මාධ්‍යකරුවන් පැමිණීමේ වැඩ සටහන සඳහා මාධ්‍යකරුවන් 183 ක් සහභාගි වී තිබුණි. එසේ වුවත්, අපේක්ෂිත ප්‍රතිඵල ලඟාකර ගැනීම පිණිස වැඩසටහන් සඳහා මාධ්‍යකරුවන් තෝරා ගැනීමේ නිර්නායක තීරණය කර නොතිබුණි.

(iii) මෙම වැඩ සටහන සඳහා රු. මිලියන 22.9 ක් වැය කර තිබුණද විදේශ මාධ්‍ය කරුවන් විසින් අපේක්ෂිත පරිදි මාධ්‍ය ප්‍රචාරයක් ලබා දුන් බවට සාක්ෂි නොතිබුණි.

(ඇ) ඉන්දියානු චිත්‍රපට ඇකඩමි සම්මාන උලෙල -ඉ.චි.ඇ.ස.

රු. මිලියන 478 ක් මෙම උළෙල සඳහා වැය කර තිබුණු අතර, මුළු වියදමෙන් රු. මිලියන 141 ක් සමාලෝචිත වර්ෂයේදී උපචිත වියදම් ලෙස ගිණුම්ගත කර තබුණි. පහත දක්වා ඇති පරිදි, ඉකුත් වර්ෂය සඳහා වූ මාගේ වාර්තාවෙන් පෙන්වා දෙන ලද ඇතැම් කරුණු සමාලෝචිත වර්ෂය තුලදීද නිරවුල් වී නොතිබුණි.

(i) ඉන්දියානු චිත්‍රපට ඇකඩමි සම්මාන උළෙලේ ක්‍රිකට් තරඟාවලිය:

- මුද්‍රණය කල ප්‍රවේශපත්‍ර ප්‍රමාණය, ඒවායේ අනුක්‍රමික අංක හා ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම් භාර ගැනීම යනාදියට අදාල තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.
- ගරු අමාත්‍යවරයා ලබාදී තිබුණු නියෝග වලට පටහැනිව ප්‍රවේශ පත්‍ර අලෙවි කිරීමේ කටයුතු පෞද්ගලික සමාගමකට පවරාදී තිබුණි.
- සමාගම විසන් එකතු කර තිබුණු රු. 12,826,500 ක මුදලින් රු. 9,929,490 ක් ක්‍රීඩා පිටියේ වියදම් ලෙස වැය කර තිබුණි.
- තරඟාවලියේ අරමුණට අනුව පුණ්‍ය කටයුතු සඳහා යොදා ගැනීම පිණිස රු. 2,554,609 ක මුදලක් යුනිසෙෆ් ආයතනයට භාරදීම සඳහා සමාගම විසින් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට ලබාද තිබුණි. එසේ වුවත්, මෙම මුදල යුනිසෙෆ් ආයතනයට භාරදුන් බවට අදාල සාක්ෂි නොතිබුණි.
- මෙයට අමතරව, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය වෙනමම එකතු කර තිබුණු රු. 7,897,000 ක ප්‍රවේශපත්‍ර ආදායමක් කාර්යාංශයට හෝ සමාගමට භාරදී නොතිබුණි.

(ii) ගුවන් ගමන් පහසුකම් සැපයීම:

සහභාගිවූවන් 436 ක් පමණක් කාර්යාංශයෙන් සපයන ලද ගුවන් ගමන් පහසුකම් ලබාගෙන තිබුණි. එසේ වුවත් අවශ්‍ය කරන ගුවන් යානා ප්‍රමාණය සැලකිල්ලට ගැනීමකින් තොරව කුලී ගුවන් යානා හතරක් රු. මිලියන 58.8 ක අතිරේක පිරිවැයක් දරා ලබාගෙන තිබුණි. විගණනය විසින් කරන ලද විමර්ශනයකට අනුව, ඉන්දියානු චිත්‍රපට ඇකඩමි සම්මාන උලෙල සඳහා පැමිණි 09 දෙනෙකු 2012 සැප්තැම්බර් 30 දින දක්වා එනම් වර්ෂ 02 කාලයක් ගත වූ පසුවද රටින් බැහැර වී නොතිබුණි. මෙම නිසා ඉන්දියානු චිත්‍රපට ඇකඩමි සම්මාන උලෙල විගණනයට ඉදිරිපත් කර තිබුණු උලෙල සඳහා සහභාගිවූවන්ගේ නම් ලැයිස්තුව ව්‍යාජ ලේඛණයක් බව පෙනී යයි. මේ නිසා ගුවන් ගමන් වියදම් වල නිවැරදිභාවය විගණනයේදී තහවුරු කරගත නොහැකි විය.

(iii) ගොඩබිම ගමන් පහසුකම් සැපයීම:

ගොඩබිම ගමන් සඳහා අයවැයගත මුදල රු. මිලියන 8 ක් විය. එසේ වුවත් සාමාන්‍ය හා සුඛෝපභෝගී වාහන සැපයීම වෙනුවෙන් පිළිවෙලින් රු. මිලියන 15 ක් සහ රු. මිලියන 2.5 ක් වැයකර තිබුණි. වාහන අංක, පිටත් වූ පැමිණි වේලාවන් සහ ගමන් කල ස්ථාන යනාදී මූලික තොරතුරු නොමැතිව ගෙවීම් සිදුකර තිබුණි. මේ නිසා ගෙවීම්වල නිවැරදිභාවය සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කල නොහැකි විය

(iv) නවාතැන් පහසුකම් සැපයීම:

විගණනයට ලැබුණු තොරතුරු වලට අනුව, උලෙල සඳහා අමුත්තන් 450 ක් සහභාගි වී තිබුණි. මේ අනුව අමුත්තන්ට දින 4 ක කාලයක් නවාතැන් ගැනීම සඳහා රාත්‍රී නවාතැන් දින 1800 (450x4) ක ප්‍රමාණයක් ප්‍රමාණවත් විය යුතුව තිබුණි. එසේ වුවත්, රාත්‍රී නවාතැන් දින 3,784 ක් භාවිතා කර තිබුණි. කාමර භාවිතා කල සහභාගිවූවන්ගේ සහ අමුත්තන්ගේ විස්තර නොමැති වීම නිසා මෙවැනි රාත්‍රී නවාතැන් දින සංඛ්‍යාවක් භාවිතා කර තිබීම නාස්තිකර වියදමක් ලෙස නිරීක්ෂණය වේ.

3.2 අරමුදල් ඌණ උපයෝජනය
-----------------------------

සමාලෝචිත වර්ෂය තුලදී නිශ්චය කරන ලද රටවල් ප්‍රවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සඳහා රු. මිලියන 149 ක් වෙන්කර තිබුණද, අවිධිමත් මෙහෙයුම් සැලසුම් හේතුවෙන් රු. මිලියන 57 ක් පමණක් වැඩසටහන් සඳහා උපයෝජනය කර තිබුණි.

3.3 ආර්ථික නොවූ ගනුදෙනු
--------------------------

තථ්‍ය අවශ්‍යතාවය සඳහා කාර්යාංශයේ අරමුදල් ප්‍රමාණය ඇගයීමකින් තොරව ඉන්දියානු චිත්‍රපට ඇකඩමි සම්මාන උලෙල සඳහා රු. මිලියන 200 ක බැංකු ණය මුදලක් 2010 ජුනි 02 දින ලබාගෙන තිබුණි. රු. මිලියන 120 ක් රු. 300,000 ක පොලියකුත් සමඟ දින 20 කට පසුව ආපසු ගෙවා තිබුණි. ඉතිරි ශේෂය වූ රු. මිලියන 80 ක මුදල සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. 2011 නොවැම්බර් අවසානය දක්වා රු. මිලියන 10.9 ක මුදලක් පොලිය ලෙස ගෙවා තිබුණු අතර 2011 නොවැම්බර් දක්වා වර්ෂ දෙකකට වැඩි කාලයක් රු. මිලියන 80 ක ණය ශේෂය නිෂ්කාර්ය වත්කමක් ලෙස තබාගෙන තිබුණි.

3.4 මානව සම්පත් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විගණනයට ඉදිරිපත් කල තොරතුරු වලට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා කාර්යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය 85 ක් විය. සමාලෝචිත වර්ෂය තුල හා ඉකුත් වර්ෂය තුල කාර්යාංශයේ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිවෙලින් 46 ක් සහ 57 ක් විය. සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂයේදී මානව සම්පත් සඳහා මුළු පිරිවැය වශයෙන් කාර්යාංශය පිළිවෙලින් රු. මිලියන 26.1 ක් හා රු. මිලියන 22.4 ක් වැය කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂයේදී සේවකයකු සඳහා පිරිවැය පිළිවෙලින් රු. 567,391 ක් හා රු. 392,982 ක් විය.

(ආ) 2005 අංක 38 දරන සංචාරක පනතේ VII වගන්තියේ සඳහන් නියමයන්ට සහ භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමත කල බඳවා ගැනීමේ පරිපාටියට පටහැනිව කාර්යාංශයේ කළමනාකරණ අධ්‍යක්ෂවරයා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණි.

3.5 වාහන උපයෝජනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුලදී මොටර් වාහන දෙකක් (මෝටර් රථයක් හා වෑන් රථයක්) කාර්යාංශයට අයත්ව තිබුණි. විගණනයට ඉදිරිපත් කළ තොරතුරු වලට අනුව, සමාලෝචිත වර්ෂය තුලදී ධාවනය කරන ලද කිලෝමීටර් ප්‍රමාණය සහ ධාවන පිරිවැය පිළිවෙලින් කිලෝමීටර් 52,313 ක් සහ රු. 2,681,924 ක් විය. මේ අනුව ක්ෂය වූ වටිනාකම නොමැතිව ධාවන පිරිවැය රු. 51.26 ක් විය.

(ආ) මෙයට අමතරව, සමාලෝචිත වර්ෂය තුලදී මෝටර් වාහන කුලියට ලබා ගැනීම සඳහා රු. 1,259,857 ක් ගෙවා තිබුණි. එසේ වුවත්, කුලියට ගත් වාහන සංඛ්‍යාව විගණනයට ඉදිරිපත් නොකෙරුණි. ධාවනය කල දුර ප්‍රමාණය කිලෝ මීටර් 46,867 ක් විය. මේ අනුව කුලියට ගත් මෝටර් රථවල කිලෝමීටර්යකට පිරිවැය රු. 26.88 ක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂයේ කුලියට ගත් වාහන වල පිරිවැය සහ වාහන නඩත්තු පිරිවැය ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී පිළිවෙලින් රු. 652,840 කින් හෙවත් 38% කින් හා රු. 531,584 කින් හෙවත් 88% කින් ඉහල ගොස් තිබුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

4.1 සංයුක්ත සැලැස්ම

2011 සිට 2013 දක්වා වූ සංයුක්ත සැලැස්මක් කාර්යාංශය පිළියෙල කර තිබුණද, එය විගණනය වෙත ඉදිරිපත් කරන ලද්දේ 2010 මැයි 10 දින පැවති රාජ්‍ය ගිණුම් කාරක සභාව කරන ලද නියෝගයෙන් පසුව 2012 ජුලි 20 දිනදී වන අතර එනම් සැලසුම ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වර්ෂයේ සිට මාස 18 ක් ඉක්ම ගිය පසුවය. එයට අමතරව, කළමනාකරුවන්ගේ වගකීම්ද ඇතුලත්ව සැලසුම් කල කාලය තුල ලඟාකර ගත යුතු පරමාර්ථ සහ ඉලක්කයන් සංයුක්ත සැලැස්මේ ඇතුලත් කර නොතිබුණි.

4.2 ක්‍රියාකාර සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාර සැලැස්මක් පිළියෙල කර තිබුණි. එසේ වුවත්, ක්‍රියාකාර සැලැස්මේ දක්වා තිබුණු ව්‍යාපෘති / වැඩ සටහන් වල මූල්‍ය හෝ භෞතික කාර්ය සාධන ඇගයීමකට ලක්කර නොතිබුණි. එසේම, සංයුක්ත සැලැස්මේ දක්වා තිබුණු මඟ පෙන්වීම් සැලකිල්ලට ගැනීමකින් තොරව ක්‍රියා කාර සැලැස්ම පිළියෙල කර තිබුණි.

4.3 අයවැය ලේඛනමය පාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අයවැය ලේඛනයක් පිළියෙල කර තිබුණද, 1971 අංක 38 දරන මුදල් පනතේ 8(1) වගන්තිය ප්‍රකාරව, මුදල් වර්ෂය ආරම්භ වීමට මාස 3 කට පෙර අයවැය ලේඛනය සඳහා පාලක මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත හා තථ්‍ය සංඛ්‍යා අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව දක්නට ලැබුණි.

4.4 අභ්‍යන්තර විගණන කටයුතු

කාර්යාංශයේ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම සඳහා 2007 වර්ෂයේ සිට අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබුණි. කාර්යාංශයේ අභ්‍යන්තර විගණන කටයුතු අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මගින් ආවරණය කර තිබුණි.

5. පද්ධති හා පාලන

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර කර්යාංශයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) අලෙවිකරණ හා ප්‍රවර්ධන කටයුතු
(ආ) විදේශ රටවල පිහිටුවන ලද උපකාර්යාල කළමනාකරණය
(ඇ) අයවැය
(ඈ) මානව සම්පත් කළමනාකරණය
(ඉ) වත්කම් කළමනාකරණය
(ඊ) ප්‍රසම්පාදනයන්
(උ) අභ්‍යන්තර විගණනය
(ඌ) ගිණුම්කරණය හා පොත් තැබීම
(එ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
(ඒ) අත්තිකාරම් ගෙවීම්.